# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

**මාධ්‍ය නිවේදනය**

**සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වන වීඩියෝ පටයක් සම්බන්ධව - පින්දෙනිය පොලිස් ස්ථානය.**

රථ වාහන රාජකාරියේ යෙදී සිටින කාන්තා උප පොලිස් පරීක්ෂකවරියක් හා රියදුරෙකු අතර සිදුවන සංවාදයක වීඩියෝ දර්ශනයක් මේ දිනවල සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වෙමින් පවතී. මෙම සිදුවීම 2024.05.16 වන දින කෑගල්ල පොලිස් කොට්ඨාසයේ පින්දෙනිය පොලිස් වසමේ සිදුව ඇත.

පින්දෙනිය පොලිස් ස්ථානයට අනුයුක්ත කාන්තා උප පොලිස් පරීක්ෂකවරියක්, පොලිස් සැරයන්වරයෙකු, කාන්තා පොලිස් සැරයන්වරියක් හා කාන්තා පොලිස් කොස්තාපල්වරියක් රථවාහන රාජකාරියේ නිරතව සිටියදී අවිස්සාවේල්ල දෙස සිට ගලිගමුව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් පරීක්ෂා කිරීම සඳහා පොලිස් සැරයන්වරයා විසින් නවතන ලෙසට සංඥා කර ඇත. එම අවස්ථාවේ අදාල ත්‍රීරෝද රථයේ රියදුරු එම පොලිස් නිලධාරියාට දෝෂාරෝපනය කර ඇති අතර එම නිලධාරියා විසින් ත්‍රීරෝද රථ රියදුරුව කාන්තා උප පොලිස් පරීක්ෂකවරිය වෙත යොමු කර ඇත.

ඒ අනුව එම නිලධාරිණිය විසින් ත්‍රීරෝද රථයේ ලියවිලි පරීක්ෂා කිරීමේදී එහි ආදායම් බලපත්‍රය නුවර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුටත්, රක්ෂණ සහතිකය දැරණියගල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුටත් අයත්ව තිබී ඇත. මේ සම්බන්ධව එම රියදුරුගෙන් විමසීමෙන් අනතුරුව ත්‍රීරෝද රථය සන්තකයේ පවරා නොගැනීම සම්බන්ධව ත්‍රීරෝද රථ රියැදුරුට තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කොට රියදුරු බලපත්‍රය පොලිස් භාරයට ගෙන ඇත.

අනතුරුව ත්‍රීරෝද රථ රියදුරු පින්දෙනිය පොලිස් ස්ථානයට පැමිණීමෙන් පසු ස්ථානාධිපතිවරයාට ඉදිරිපත් කර ඇති අතර ස්ථානාධිපති විසින් එම රියදුරුට මේ සම්බන්ධව කරුණු පැහැදිලි කර දී ත්‍රීරෝද රථයේ රක්ෂණ සහතිකයේ හිමිකරු කැඳවාගෙන එන ලෙස දැනුම් දුන්නද ඔහු එය කිසිදු ගණනකට නොගෙන එය ප්‍රතික්ෂේප කර ඇත.

මෙම ත්‍රීරෝද රථයේ ලියාපදිංචි පොතද අදාල ත්‍රීරෝද රථයේ රියදුරු විසින් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2024.05.21 වන දින මෙම ත්‍රීරෝද රථය තම සන්තකයට නිසි පරිදි පවරා නොගෙන එහි හිමිකරුවෙකු ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් මෝටර් වාහන පනතේ 12 (2) හි සඳහන් ප්‍රතිපාදන අනුව කෑගල්ල ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර එහිදී රියදුරු වරද පිළිගැනීමෙන් පසු රුපියල් 5000/= ක දඩ මුදලක් ගෙවීමට ගරු අධිකරණය මඟින් නියෝග කර ඇත.

තවද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය මඟින් නිසි පරිදි ත්‍රීරෝද රථය නීත්‍යානුකූලව පවරා නොගැනීම පිලිබඳව පරීක්ෂා කිරීම අතරතුර සිදු වූ සංවාදයක් නැවත සංස්කරණය කර ශ්‍රී ලංකා පොලිසියේ කීර්ති නාමයට හානි වන අයුරින් සමාජ මාධ්‍ය වෙත මුදා හරින ලද පුද්ගලයා සම්බන්ධව ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පින්දෙනිය පොලිසිය විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**